**ශීර්ෂය 16 - පාර්ලිමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 16 - පාර්ලිමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 සැප්තැම්බර් 14 දින පාර්ලිමේන්තුවේ මහලේකම් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙළ කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

---

## 2.1 විසර්ජන ගිණුම

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

පාර්ලිමේන්තුව සඳහා සලසා තිබූ මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,860.35 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු.මිලියන 1,731.68 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 128.67 ක් හෙවත් සියයට 6.92 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත සඳහන් වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 1,787.50 | 1,672.89 | 114.61 | 6.41 |
| මූලධන | 72.85 | 58.79 | 14.06 | 19.30 |
| **එකතුව** | **1,860.35** | **1,731.68** | **128.67** | **6.92** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

පාර්ලිමේන්තුවට අදාළ විෂය අංක 01601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 39.34 | 26.14 | 28.34 | 34.15 | 175.00 | 127.42 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

පාර්ලිමේන්තුවේ අංක 6000/0000/00/0015/0004/000 දරන පොදු තැන්පත් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 3.78 ක් විය.

## 2.4 විගණන නිරීක්ෂණය

පාර්ලිමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙළ කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණයන්ගෙන් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පාර්ලිමේන්තුව විසින් පහත දැක්වෙන බඩු ලේඛන පොත යාවත්කාලීන කර නොතිබුණු අතර අනෙක් ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (අ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| (ඇ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |
| (ඈ) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය |

| | | |
|---|---|---|
| (ඉ) | ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තා | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3(අ) මාර්ගෝපදේශය |
| (ඊ) | ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය |
| (උ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ඌ) | බඩු ලේඛන පොත | මුදල් රෙගුලාසි 454(1) |

**3.2 විගණන සාක්ෂි නොවීම**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනුමත බඳවා ගැනීමේ පටිපාටිය සහ උසස් කිරීමේ පටිපාටිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) කථානායකතුමාගේ නිල නිවස පිහිටි ඉඩම, ජයවඩනගම කාර්ය මණ්ඩල නිවාස පිහිටි ඉඩම සහ නුවරඑළිය සෙන්පති නිවස පිහිටි ඉඩම යන ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

**3.3 විගණන විමසුම්වලට පිළිතුරුදීම**

------------------------------------

පාර්ලිමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 08 කට 2016 ජුනි 30 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**3.4 විසර්ජන ගිණුම**

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු.500,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

(ආ) පුනරාවර්තන වැය විෂයයන් 31 ක් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**3.5 පොදු තැන්පත් ගිණුම**

------------------------

වර්ෂ 2 ක් ඉක්ම වූ එකතුව රු.442,048 ක් වූ තැන්පතු 06 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 01601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විශ්‍රාම ගිය සහ මිය ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.414,539 ක ණය ශේෂ 2004 වර්ෂයේ සිට වර්ෂ 11 ක් ගත වී තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනිමට පාර්ලිමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) සේවය අත්හැර ගිය නිලධාරීන්ගේ 11 දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු.866,732 ක ණය ශේෂ වර්ෂ 11 සිට වර්ෂ 19 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වෙනත් ණය වශයෙන් සඳහන් කර තිබුණු රු.104,040 ක ණය ශේෂය තුළ වූ 2007 වර්ෂයේ සිට පැවත එන රු.98,540 ක ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත්, අය කර ගෙන නොතිබුණි.

## 3.7 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.7.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

පාර්ලිමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කර තිබුණද, එම ක්‍රියාකාරී සැලැස්ම 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය දක්වා ඇති කරුණු අන්තර්ගත වන පරිදි පිළියෙළ කර නොතිබුණි.

### 3.7.2 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

**(අ) විගණන සැලැස්ම පිළියෙල කිරීම**

2009 ජුනි 09 දිනැති අංක ඕඑම්ජී/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 6 හා 7 ඡේදවල සඳහන් කර ඇති පරිදි වාර්ෂික විගණන සැලැස්ම පූර්ව විමසුමට භාජනය කර හා අදාළ ආකෘති 02 හි දක්වා ඇති කරුණු ඇතුළත් වන පරිදි පිළියෙල කර නොතිබුණි.

**(ආ) අභ්‍යන්තර විගණන වාර්තා නිකුත් කිරීම**

2015 වර්ෂයට අදාළව අභ්‍යන්තර විගණන වාර්තා 03 ක් නිකුත් කර තිබුණි.

## 3.8 වත්කම් කළමනාකරණය

පාර්ලිමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(i) මිලදී ගත් දිනයේ හෝ පරිගණක ගත කළ දිනයේ සිට කිසිදු නිකුත් කිරීමක් සිදු නොකළ භාණ්ඩ අයිතම 207 ක් ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි. එම අයිතම තුළරු.3,728,225 ක් වටිනා අයිතම 106 ක්ද, වටිනාකම් සඳහන් නොවූ අයිතම 101 ක්ද විය.

(ii) අවශ්‍ය තොග ප්‍රමාණය ඉක්මවා මිලදී ගැනීමට කටයුතු කිරීම නිසා ඇණවුම් කළ භාණ්ඩ වලින් සියයට 25 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයන් ඉතිරි වූ අයිතම 301 ක් ගබඩාවේ පැවතුණි. මෙයින් අයිතම 109 ක වටිනාකම රු.389,448 ක් වූ අතර ඉතිරි අයිතම 292 ක වටිනාකම සඳහන් කර නොතිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2016 ජුනි 30 දින වන විටත් 2015 වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි.

## 3.9 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) මුදල් රෙගුලාසි109 (ආ) | - | පොතෙන් අස්කිරීමේ නියෝගවල පිටපත් විගණකාධිපති වෙත එවා නොතිබුණු අවස්ථා පැවතුණි. |
| (ii) මුදල් රෙගුලාසි137 | 336,459 | වවුචර් 10 ක් අනුමත කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 762 | - | ගබඩාව තුළ වසර 10 කට වඩා පැරණි තොග නිෂ්කාර්යව පැවතුණි. |

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ
-----------------------------

| | | |
|---|---|---|
| 2010 මැයි 24 දිනැති අංක 08/2010 දරන චක්‍රලේඛයේ 05 ඡේදය | 248,839 | ඉන්ධන දීමනා උපරිම සීමාවන් ඉක්මවා වියදම් කිරීමට හෝ ඒ සඳහා වැය කරන අතිරේක වියදම් පියවීමට, බිල්පත් ඉදිරිපත් නොකළ යුතු බව දක්වා තිබුණත්, එම විධිවිධානයට පටහැනිව කටයුතු කර තිබුණි. |

(ඇ) ජාතික අයවැය චක්‍රලේඛ
-----------------------------

| | | |
|---|---|---|
| 2014 ජනවාරි 01 දිනැති අංක 01/2014 දරන චක්‍රලේඛයේ 2.1.3 ඡේදය | 2,022,535 | ඉන්ධන, විදුලිය, ජලය සහ ප්‍රවාහනය සඳහා දරන වියදම් වාර්ෂික ප්‍රතිපාදන සීමාවන් නොඉක්මවන පරිදි, බිල්පත් ලැබී මසක් ඇතුළත නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වුවත්, 2014 වර්ෂයට අදාළ ඉන්ධන බිල්පත් 2015 මැයි, ජුනි මාසවලදීද නිරවුල් කර තිබුණි. |

**3.10 කාර්යසාධනය**
**----------------**

2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ භෞතික හා මූල්‍ය ඉලක්ක ස්ථාපිත කර නොතිබුණු අතර 2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව, ක්‍රියාකාරී සැලැස්ම හා කාර්යසාධන වාර්තා අනුව පාර්ලිමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) රැස්වීම් පැවැත්වීම**
**---------------------**

2015 ජනවාරි 01 දින සිට 2015 ජුනි 26 දින දක්වා 7 වන පාර්ලිමේන්තුවේ රැස්වීම් 41 ක්ද, 2015 සැප්තැම්බර් 01 දින සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා 8 වන පාර්ලිමේන්තුවේ රැස්වීම් 41 ක්ද, වශයෙන් 2015 වර්ෂයේදී රැස්වීම් 82 ක් පවත්වා තිබුණි. එම රැස්වීම් 82 හි සහභාගිත්වය පහත පරිදි විය.

| සහභාගිත්වය | 7 වෙනි පාර්ලිමේන්තුව පැවති කාලයට අදාළ රැස්වීම් වාර ගණන | 8 වෙනි පාර්ලිමේන්තුව පැවති කාලය අදාළ රැස්වීම් වාර ගණන |
|---|---|---|
| 76-100 | 6 | - |
| 101-125 | 3 | 3 |
| 126-150 | 13 | 6 |
| 151-175 | 12 | 19 |
| 176-200 | 2 | 8 |
| 201-225 | 5 | 5 |
| **එකතුව** | **41** | **41** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2015 වර්ෂයේ රුස්වීම් සඳහා සහභාගීත්වය පරීක්ෂා කිරීමේදී, රැස්වීම් වාර 41 තුළ 7 වන පාර්ලිමේන්තුවේ 2/3 කට වඩා වැඩියෙන් මන්ත්‍රීවරුන් සහභාගි වූ රැස්වීම් 19 ක්ද, 8 වන පාර්ලිමේන්තුවේ 2/3 කට වඩා වැඩියෙන් සහභාගී වූ රැස්වීම් වාර ගණන 32 ක් ද වී තිබුණි.

(ii) 7 වන පාර්ලිමේන්තුව පැවති කාල සීමාව තුළදී රැස්වීම් සඳහා මන්ත්‍රීවරුන් 100 කට අඩුවෙන් සහභාගි වූ රැස්වීම් වාර 6 ක් පැවති නමුත් 8 වන පාර්ලිමේන්තුවේ රැස්වීම් සඳහා මන්ත්‍රීවරුන් 100 කට වැඩියෙන් සහභාගිත්වයක් පැවතුණි.

**(ආ) පනත් කෙටුම්පත් කාර්යාංශය**

2015 වර්ෂයේදී දින 82 ක් පාර්ලිමේන්තු රැස්වීම් වාර පවත්වා තිබුණු අතර රජයේ පනත් කෙටුම්පත් 16 ක් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන 01 ක් ඇතුළුව පනත් 17 ක් සම්මත කර තිබුණි.

**(ඇ) පාර්ලිමේන්තුවේ නිල ජංගම දුරකථන යෙදුම නිර්මාණය කිරීම**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පාර්ලිමේන්තුව වෙනුවෙන් නිල ජංගම යෙදුම නිර්මාණය කිරීම පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබුණි.

(ii) 2015 වර්ෂය වෙනුවෙන් පිළියෙළ කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙහි ජංගම යෙදුම නිර්මාණය කිරීම වෙනුවෙන් වැය කිරීමට අපේක්ෂිත ඇස්තමේන්තුගත වියදම ඇතුළත් කර නොතිබුණි.

(iii) පාර්ලිමේන්තුවේ ජංගම යෙදුම නිර්මාණය කිරීම සඳහා පුවත්පත් දැන්වීමට අනුව මිල ගණන් ලැබී නොතිබුණ නිසා විද්‍යුත් තැපැල මගින් ආයතන 20 කින් මිල කැඳවීම් සිදුකර තිබුණු අතර ජංගම යෙදුම නිර්මාණය කිරීම සිදු කරන රාජ්‍ය ආයතනවලින් මිල ගණන් කැඳවීමට අවධානය යොමු වී නොතිබුණි.

**3.11 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**
**-----------------------------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** පාර්ලිමේන්තු නිල බැංකු ගිණුමට අමතරව ඇති වෙනත් ජංගම ගිණුම් 03 ක 2015 දෙසැම්බර් 31 දිනට රු.18,498,074 ක ශේෂයක් පැවතුණි.

**(ආ)** ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ඉක්මවූ එකතුව රු.192,392 ක් වටිනා චෙක්පත් 11 ක් සම්බන්ධයෙන් මු.රෙ.396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.12 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**
**-------------------------------**

පාර්ලිමේන්තුව විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

**(අ) මාදිවෙල නිවාස අලුත්වැඩියාව**
**---------------------------------**

මාදිවෙල මන්ත්‍රී නිල නිවාස සංකීර්ණයේ නිවාස 64 ක වහල අලුත්වැඩියා කිරීම සඳහා රු.8,003,742 ක දළ ඇස්තමේන්තුවක් සකස් කර, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සහය ඇතිව පිළිසකර කර තිබුණි. 2015 නොවැම්බර් 20 දින වන විට එම කාර්ය සඳහා රු.5,010,500 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) නිවාස අලුත්වැඩියා කිරීම සඳහා ලී වර්ග අඩි 11,340 ක් රු.1,905,120 කට මිලදීගෙන තිබුණි. පාර්ලිමේන්තුවේ ඉංජිනේරු අංශය විසින් අලුත්වැඩියා කළ නිවාස 08 ක් සඳහා වර්ග අඩි 1546 ක ලී යොදා ගෙන තිබුණි. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් අලුත්වැඩියා කරන ලද නිවාස 56 සඳහා වර්ග අඩි 5600 ක ලී ප්‍රයෝජනයට ගත් බව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ වාර්තාව මගින් ප්‍රකාශ කර ඇත. ඒ අනුව රු.704,592 ක් වටිනා වර්ග අඩි 4194 ක ලී තොග ඉතිරි වී තිබුණි.

(ii) මෙම අලුත්වැඩියාව සඳහා දෙහිවල සිට මාදිවෙල දක්වා අස්බැස්ටෝස් ෂීට් 800 ක් වාර 2කදී ප්‍රවාහනය කිරීමට සහ ඒවා පැටවීමේ හා බෑමේ කුලී වෙනුවෙන් රු. 196,900 ක් ඉහත ලී මිලදී ගත් ආයතනයට ගෙවා තිබුණු අතර එම කාර්යය යෙලෝපේජස් වෙතින් මිල කැඳවීමේදී වරකට රු.38,000 ක්ද, කොළඹ දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටු වාර්තා අනුව වරකට රු.30,000 කට වඩා අඩුවන බවද අනාවරණය විය.

(iii) මාදිවෙල මන්ත්‍රී නිවාස සංකීර්ණයේ අලුත්වැඩියාව භෞතිකව පරීක්ෂා කිරීමට ගියද ඒ සඳහා අවස්ථාව නොලැබුණු අතර නිවාස සංකීර්ණයෙන් ඉවත් කරන ලද ලී සහ අස්බැස්ටෝස් ෂීට් පිළිබඳවද භෞතිකව සනාථ කර ගැනීමට අවස්ථාවක් නොලැබුණි.

(iv) මන්ත්‍රී නිවාස සංකීර්ණය අලුත්වැඩියාව සඳහා රු. 623,700 ක ලී මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ඇ) ප්‍රකාරව කොන්ත්‍රාත්කරු සමග ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

**(ආ) සමරු භාණ්ඩ අලෙවි සැල නවීකරණය**

**--------------------------------------**

සමරු භාණ්ඩ අලෙවිසැල නවීකරණය කිරීමට රු.1,693,920 ක ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි. ඒ සඳහා රු.2,539,425 ක් වැය කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත වටිනාකම ඉක්මවා රු.845,505 ක් හෙවත් සියයට 50 ක් වැඩිපුර වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමරු භාණ්ඩ අලෙවිසැලේ පිටුපස පිහිටි ගබඩාව කුඹුක් වැනි වටිනාකමෙන් වැඩි දැව වර්ග යොදවා වර්ග අඩි 16.12 ක ප්‍රමාණයක් ආවරණය කර තිබුණි. ඒ සඳහා රු.278,070 ක් වැයකර තිබුණි. සමරු භාණ්ඩ අලෙවි සැලේ පිටුපස පිහිටි මෙම ගබඩාව පිටතින් සිටින අයට සෘජුව දෘශ්‍යමාන නොවන බැවින් ඒ සඳහා එවැනි වටිනා දැව වර්ග යෙදීමේ අවශ්‍යතාවක් නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ii) ආයතනය විසින් පිළියෙල කළ ප්‍රමාණ පත්‍රය අනුව ගබඩාව සඳහා වර්ග මීටර් 9.8ක ලෝහ රාක්ක 6ක් සවිකිරීම සඳහා රු.350,350 ක් ඇස්තමේන්තු කර තිබුණි. වර්ග මීටර් 8.41ක ලෝහ රාක්ක 8 ක් සාදා ඒ වෙනුවෙන් රු.420,500 ක් ගෙවා තිබුණි. එම කොටසෙහි ඉඩකඩ ප්‍රමාණවත් නොවුණ අතර සිවිලිම් මට්ටමට ඉතා ආසන්න උසක් පැවති රාක්කවල ඉහළ තට්ටුවල භාණ්ඩ ඇසිරීමටද නැවත ගැනීමටද අපහසුව පැවතුණි. එම රාක්ක 06 ද ඌණ උපයෝජිත තත්ත්වයක පැවැතුණ අතර රාක්ක 08 කින් එක් රාක්කයක් එම කාමරයෙන් ඉවත් කිරීමටද සිදු වී තිබුණි.

**3.13 අවිධිමත් ගනුදෙනු**

**--------------------**

පාර්ලිමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

**-------------------------------------------------------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 මාර්ගෝපදේශය ප්‍රකාරව රු.2,699,493 ක පෝසිලේන් භාණ්ඩ මිලදී ගැනීමේ කොන්ත්‍රාත්තුවේදී මිල ගණන් විවෘත කිරීමේ කමිටුවේ සාමාජිකයින් විසින් නම, තනතුර දක්වා අත්සන් කර නොතිබුණ අතර ලංසු විවෘත කිරීමේ කමිටු වාර්තාවේ එක් එක් ආයතනය ඉදිරිපත් කරන ලද ලංසු මිල ගණන් දක්වා නොතිබුණි.

**(ii)** **රජයේ** ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4. මාර්ගෝපදේශය ප්‍රකාරව තරඟකාරී මිල කැඳවීමකින් තොරව පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය සඳහා පෞද්ගලික ආයතනයකින් පාවහන් යුගල 84 ක් එකක් රු.2,000 බැගින් රු.168,000 කට මිලදී ගෙන තිබුණි.

**3.14 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු**

---

2014 වර්ෂයේදී රු.1,827,100 ක්ද හා 2015 වර්ෂයේදී එකතුව රු.1,783,665 ක්ද, වැය කර ඉන්ධන, ලී, ප්‍රවාහන, කාර්යාලීය උපකරණ හා මුළුතැන්ගෙයි උපකරණ ඇතුළුව භාණ්ඩ හා සේවා මිලදී ගෙන තිබුණි. එම ආයතනය සම්බන්ධයෙන් සිදු කර තිබුණු භෞතික පැවැත්ම පිළිබඳව පරීක්ෂාවේදී එම ආයතනය භාණ්ඩ හා සේවා සපයන ව්‍යාපාරික ස්ථානයක් නොවන බවත්, එකම ලිපිනයක්, එකම දුරකථන අංක හා ෆැක්ස් අංක සහිත නම් 02 කින් පෙනී සිට ලිපි ශීර්ෂ 03 ක් භාවිතා කර ගනුදෙනු කරන ස්ථානයක් බව විගණනයේදි අනාවරණය විය.

**3.15 පාඩු හා හානි**

---

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) අවශ්‍ය ප්‍රමාණයට වඩා බඩු තොග ඇනවුම් කර ගබඩා කර තිබීමෙන් අයිතම් 28 ක කාලය ඉකුත් වී තිබුණි. මෙයින් වටිනාකම් හඳුනා ගත් අයිතම් 20 කින් සිදුව තිබූ අලාභය රු.501,982 ක් විය.

(ආ) විවෘත ස්ථාන 3 ක පැවති ගබඩා, ප්‍රධාන ගබඩාවේ පාලනයෙන් බැහැරව පැවති අතර එවැනි ස්ථානයක පැවති ගබඩාවක ලී තොග පරීක්ෂාවේදී රු.511,217 ක් වටිනා දැව ඌනතාවයක් පැවතුණි.

(ඇ) 2015 නොවැම්බර් 06 දින පාර්ලිමේන්තුව සතු වාහනයකට සිදු වූ අනතුරින් රු.109,237 ක අලාභයක් සිදුව තිබූ අතර එම අලාභය රක්ෂණ සමාගමෙන් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

**3.16 අනාර්ථික ගනුදෙනු**

---

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) පාර්ලිමේන්තු මහලේකම් කාර්ය මණ්ඩලයේ නිල ඇඳුම් හිමි තනතුරු දරන නිලධාරීන් 474 ක් වෙනුවෙන් පාවහන් යුගල 510 ක් මිලදී ගෙන තිබීම නිසා යුගල 36 ක් වෙනුවෙන් අවශ්‍යතාවය ඉක්මවා රු.98,280 ක් වැය කර තිබුණි.

(ආ) පාර්ලිමේන්තුව විසින් ද්විතියික සිසිලක ජල පොම්ප 03 ක් මිලදී ගෙන ඒවා සවි නොකර ගබඩාවේ රඳවා ගෙන තිබුණි. එම ජල පොම්ප තුන සඳහා අළුත්වැඩියා කිරීමක් අවශ්‍ය වී නොතිබුණත්, රු.939,100 ක් වටිනා අමතර කොටස් මිලදී ගෙන එම අමතර කොටස්ද ගබඩා කර තිබුණි.

**3.17 විසඳා නොතිබුණු විගණන ඡේද**

---

පාර්ලිමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2014 | 1.1 | ස්ථාවර වත්කම් ලේඛනය. |
| | 1.2(ආ) | අනුමත බඳවා ගැනීමේ පටිපාටිය සහ උසස් කිරීමේ පටිපාටිය පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබීම |
| | 1.2(ඇ) | මව්පිය පදනමින් බඳවා ගැනීම් පිළිබඳ විස්තර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| 2013 | 1.6 (අ) (i) | පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට වාර්ෂික වැටුප් වර්ධකයට අමතරව වැටුප් වර්ධක 10 ක් ලබා දී තිබුණි. |
| | 1.6 (අ) (i) | පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය සඳහා වැටුප්, දීමනා හා නිවාඩු ආදිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි සකස් කර නොතිබුණි. |

### 3.18 කළමනාකරණ දුර්වලතා

පෙර නඩත්තු කරන ලද ගබඩා දත්ත පද්ධතිය 2012 වර්ෂයේදි නව ගබඩා දත්ත පද්ධතියකට මාරු කර තිබුණත් එහි සටහන්ව තිබූ අයිතම 511 ක වටිනාකම් 2015 වර්ෂය අවසන් වන විටද නව දත්ත පද්ධතියට ඇතුළත් කර යාවත්කාලීන කිරීමට අපොහොසත් වී තිබුණි.

### 3.19 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 106 | 100 | 06 |
| (ii) | තෘතියික මට්ටම | 138 | 106 | 32 |
| (iii) | ද්විතියික මට්ටම | 276 | 191 | 85 |
| (iv) | ප්‍රාථමික | 524 | 484 | 40 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 86 | 82 | 04 |
| | එකතුව | 1,130 | 963 | 167 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුමත කාර්ය මණ්ඩලයෙන් පුරප්පාඩු 167 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ii) අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමකින් තොරව අවස්ථා 04 කදී වාර්ෂික වැටුප් වර්ධකවලට අමතරව වැටුප් වර්ධක 10 ක් ලබාදී තිබුණි.